# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2123/4 - 2019 මැයි මස 13 වැනි සඳුදා - 2019.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.සී.එෆ් 1/64

**(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

**මෛත්‍රීපාල සිරිසේන,**
ජනාධිපති.

2019 මැයි මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2019 අප්‍රේල් මස 29 වන දින අංක 2121/1 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් සංශෝධිත, 2019 අප්‍රේල් මස 22 වන දින අංක 2120/5 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2019 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) 26 වන නියෝගයේ "(ඇ) යම් තැනැත්තෙක් කණ්ඩායමක් හෝ" යන වචනවල සිට එම නියෝගයේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඇ) යම් තැනැත්තෙක්, කණ්ඩායමක් හෝ තැනැත්තන් කණ්ඩායමක් විසින් සිදු කරනු ලබන යම් ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ නිශ්චිතව දක්වනු ලබන ත්‍රස්තවාදී ක්‍රියාවක් සාක්ෂාත් කර ගැනීම උදෙසා වෙනත් යම් ක්‍රියාකාරකමක,

නිරත නොවිය යුතු අතර, මේ නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියාකරන ඒ යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් හෝ සංවිධානයක් වරදකට වරදකරු වන අතර මහාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට වසර දහයකට නොඅඩු සහ වසර විස්සකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතු ය.".

1A - G 29760 — 382 (2019/05)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) 27 වන නියෝගයේ (1) වන ඡේදයේ (ඌ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(එ) ඒ යම් තැනැත්තකුට, කණ්ඩායමකට, තැනැත්තන් කණ්ඩායමකට හෝ සංවිධානයකට මුදල් හෝ ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම හෝ මුදලින් හෝ ද්‍රව්‍යවලින් දායකත්වය ලබා දීම;

(ඒ) ඒ යම් තැනැත්තකු, කණ්ඩායමක්, තැනැත්තන් කණ්ඩායමක් හෝ සංවිධානයක් සඳහා හෝ ඒ යම් තැනැත්තකුගේ, කණ්ඩායමක, තැනැත්තන් කණ්ඩායමක හෝ සංවිධානයක ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ බෙදා හැරීම;

(ඔ) අරමුණ සඳහා සහාය දීම හෝ ඒ යම් තැනැත්තෙක්, කණ්ඩායමක්, තැනැත්තන් කණ්ඩායමක් හෝ සංවිධානයක් නියෝජනය කිරීම;

(ඕ) ඒ යම් තැනැත්තකු, කණ්ඩායමක්, තැනැත්තන් කණ්ඩායමක් හෝ සංවිධානයක් සමග යම් ගනුදෙනුවක නිරතවීම;
*හෝ*

(ක) ඒ යම් තැනැත්තකු, කණ්ඩායමක්, තැනැත්තන් කණ්ඩායමක් හෝ සංවිධානයක් වෙනුවෙන් තොරතුරු පතුරුවා හැරීමට කටයුතු සැලැස්වීම.".

(3) 32අ නියෝගයේ (1) වන ඡේදයේ -

(අ) (අ) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) කිසිම තැනැත්තකු විසින් ප්‍රසිද්ධ ස්ථානයක දී ඒ තැනැත්තාගේ හඳුනාගැනීමට කිසියම් ආකාරයකින් බාධාවක් විය හැකි පරිදි ඒ තැනැත්තාගේ සම්පූර්ණ මුහුණ සඟවාලනු ලබන යම් ඇඟළුමක්, ඇඳුමක් හෝ වෙනත් ද්‍රව්‍යයක් නොඇඳිය යුතු ය; නොපැළඳිය යුතු ය:

එසේ වුව ද, ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු, පොලිස් නිලධරයකු හෝ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයකු විසින්, ඒ තැනැත්තා හඳුනා ගැනීමට ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඒ සාමාජිකයාට, පොලිස් නිලධරයාට හෝ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයාට ඉඩ සැලැස්වීම පිණිස, ඒ තැනැත්තා ඇඳ සිටින්නා වූ හෝ පැළඳ සිටින්නා වූ දෙකන් ද ඇතුළුව ඒ තැනැත්තාගේ සම්පූර්ණ මුහුණ සඟවාලනු ලබන ඒ ඇඟළුම, ඇඳුම හෝ වෙනත් ද්‍රව්‍යය ඉවත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.";

(ආ) (ආ) අනුඡේදයේ "සම්පූර්ණ මුහුණ" යන යෙදුමේ අර්ථ නිරූපනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන්:-

"සම්පූර්ණ මුහුණ" යන්නෙන් නළලේ මුදුනේ සිට නිකටේ අග දක්වා ද දෙකන් අතර ද (එහෙත් දෙකන් නො ඇතුළත්ව) වන යම් තැනැත්තකුගේ මුහුණ අදහස් වේ;".

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.